00017

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023

අවසාන පරීක්ෂණය - 2023

SNP8340/SNP8530 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. " ළමයෙකුගේ සමස්ථ සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?" උදාහරණයක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "අධ්‍යාපන මනෝවිද්‍යාව යන ක්ෂේත්‍රය තුළ පර්යේෂණාත්මක අධ්‍යයන ක්‍රම භාවිතය අපහසු ය." හේතු දෙකක් (02) සපයමින් මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

03. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයෙකුගේ පෞරුෂය කෙරෙහි බලපාන පරිසර සාධක පහක් (05) සඳහන් කරන්න.

04. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ වැඩීම සහ සංවර්ධනයට අදාළව ආරයෙහි භූමිකාව පිළිබඳ සාකච්ඡා කරන්න.

05. කෙටිකාලීන ස්මෘතිය හා දිගුකාලීන ස්මෘතිය අතර වෙනස සුදුසු උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. "නව යොවුන් විය ආතතිය ගෙන දෙන කුණාටු සමයක් ලෙස හඳුන්වන්නේ ඇයි ?" උදාහරණ දෙකක් (02) දක්වමින් පැහැදිලි කරන්න.

07. භාෂා ඉගෙනුම් දුර්වලතා සහිත ළමයෙකුගේ මතකය වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ශිල්පීය ක්‍රම පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. ප්‍රජානන සංවර්ධනය පිළිබඳ බෲනර්ගේ න්‍යාය (Bruner's Theory of Cognitive Development) සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට පහසුකම් සැපයීමේ දී එහි භාවිතය කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09\. (i) "අධ්‍යාපන මනෝවිද්‍යාව" යන පදය පිළිගත් නිර්වචනයක් භාවිත කරමින් නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව හැදෑරීම මඟින් ගුරුවරයෙකුට ලබා ගත හැකි ප්‍රතිලාභ හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) අධ්‍යාපන මනෝවිද්‍යාව යන සංදර්භය යටතේ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත දරුවන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරුවරයෙකුගේ භූමිකාව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

10\. (i) ඉගෙනීම පිළිබඳ චර්යාවාදී න්‍යායන් සහ ඉගෙනීම පිළිබඳ ප්‍රජානන න්‍යායන් අතර වෙනස උදාහරණ තුනක් **(03)** ඇසුරින් දක්වන්න. (ලකුණු 06)

(ii) ඉගෙනීම පිළිබඳ ප්‍රජානන න්‍යායන් තුනක් **(03)** දක්වා ඉහත දැක්වූ එක් න්‍යායක මූලික මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ගුරුවරයෙකු ලෙස ඔබ ඉහත සඳහන් කළ ඉගෙනීම පිළිබඳ ප්‍රජානන න්‍යායයෙහි මූලධර්ම පන්තිකාමර ඉගෙනුම් තත්ත්වයන්ට භාවිත කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

11\. (i) පර්යේෂණාත්මක අධ්‍යයන ක්‍රම සහ පර්යේෂණාත්මක නොවන අධ්‍යයන ක්‍රම අතර වෙනස්කම් තුනක් **(03)** දක්වන්න. (ලකුණු 06)

(ii) a. පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රම හතරක් **(04)** නම් කරන්න.

b. ඉහත සඳහන් කළ පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රමයක් තෝරාගෙන ඔබගේ පන්තිකාමරයේ සිටින විශේෂ අධ්‍යාපනය අවශ්‍යතා සහිත සිසුන් අධ්‍යයනය කිරීම සඳහා ඔබට එම ක්‍රමය භාවිත කළ හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රමය පන්තිකාමරය තුළ භාවිත කිරීමේ දී ඔබ මුහුණ දෙන වාසි තුනක් **(03)** සහ අවාසි තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) ප්‍රාථමික චිත්තවේගයන් හතරක් (04) සඳහන් කර ඒවා ද්විතියික චිත්තවේගයන් සංවර්ධනය සඳහා බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ චිත්තවේගීය සංවර්ධනය ඔවුන්ගේ පෞරුෂ සංවර්ධනයට ඉතා වැදගත් ය." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? උදාහරණ තුනක් (03) දක්වමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් තුළ හිතකර චිත්තවේග සංවර්ධනයට අදාළව විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ගුරුවරයෙකු ලෙස ඔබේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. (i) පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායෙහි දී (Piajet's Theory of Cogonitive Development) සහ විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යායයෙහි (Vigotskty's Theory of Cogonitive Development) මූලික මූලධර්ම වෙන්කොට දක්වන්න. (ලකුණු 06)

(ii) පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායට අදාළව ළමුන්ගේ ප්‍රජානන සංවර්ධනයට පහසුකම් සැපයීමට ගුරුවරයෙකුට භාවිත කළ හැකි උපායමාර්ග හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ උපායමාර්ග විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සමඟ භාවිත කිරීමේ දී ගුරුවරයා මුහුණ දෙන අභියෝග තුනක් (03) සහ එම අභියෝග ජය ගැනීමට යෝජනා තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනුමට පහසුකම් සැපයීමේ දී පෙළඹීම ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි."

(i) පිළිගත් නිර්වචනයක් ඇසුරින් පෙළඹීම යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) a. පෙළඹීම පිළිබඳ මානවීය ප්‍රවේශය යටතේ ඇති න්‍යායන් දෙකක් (02) නම් කරන්න.

b. ඉහත සඳහන් කළ න්‍යායයන්ගෙන් එකක් තෝරාගෙන එම න්‍යාය යටතේ ඉදිරිපත් කළ ප්‍රධාන මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් පෙළඹවීම සඳහා ඉහත සඳහන් කළ ප්‍රධාන මූලධර්ම පන්තිකාමර තත්වයන්හි භාවිත කළ හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.